# අභ්‍යන්තර සටහන

## පළාත් මහ රෝහල - බදුල්ල

| | |
|---|---|
| දිනය | 2023.04. 11 |
| වෙත | ඒකක/ අංශ ප්‍රධානීන් මගින් සියලුම කාර්ය මණ්ඩලය |
| වෙතින් | අධ්‍යක්ෂ |
| පිටපත් | සියලුම වෘත්තිය සමිතීන්හි රෝහල් ශාඛා වල ප්‍රධානීන් - දැ.ගැ.පි. හා අ.ක.ස. |
| විෂයය | **රෝගීන්ගේ හා කාර්ය මණ්ඩලයේ මානසිකත්වය රැක බලා ගැනීමේ කාර්යයට බාධා වන පරිදි ක්‍රියා කිරීම** |
| ගොණු අංකය | BD/GH/CPMA/1/2013 |

සෞඛ්‍ය ලේකම්ගේ අංක 02-145/2003 දරණ පොදු චක්‍රලේඛ ලිපිය මගින් සෞඛ්‍ය ආයතන පරිශ්‍ර තුල කළු කොඩි ප්‍රදර්ශනය තහනම් කර ඇති නමුත් ඇතැම් වෘත්තිය ක්‍රියා මාර්ග හේතුවෙන් රෝගීන් රැක බලා ගැනීම සහ රෝගී ජීවිත බේරා ගැනීමට සෞඛ්‍ය කාර්ය මණ්ඩල ඉටු කරනු ලබන සුවිශේෂී කාර්ය භාරයට බාධා එල්ල කරමින් තව දුරටත් එම තත්වය පවතින බවට නිරීක්ෂණය වන බව සෞඛ්‍ය ලේකම්ගේ පොදු චක්‍රලේඛ ලිපි අංක 01-13/2023 මගින් අවධාරණය කර ඇත. (පිටපතක් අමුණා ඇත.)

02. ඒ අනුව, ඉහත චක්‍රලේඛයෙන් ලබා දී ඇති උපදෙස් පරිදි රෝහල් පරිශ්‍රය තුල කළු කොඩි එසවීම නොකල යුතු බවටත් බැනර් ප්‍රදර්ශනය නොකල යුතු බවටත් මෙයින් දන්වමි.

Dr. Upul Karunarathne
MBBS.MSc (Med.Admin). MD(Med.Admin)
Director
Provincial General Hospital
Badulla.

දුරකථන / தொலைபேசி / Telephone ) 0112669192 , 0112675011 ) 0112698507 , 0112694033 ) 0112675449 , 0112675280
ෆැක්ස් / பெக்ஸ் / Fax ) 0112693866 ) 0112693869 )0112692913
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் முகவரி / e-mail )postmaster@health.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / website ) www.health.gov.lk

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය / எனது இல / My No. ) නි.අ.ජ.(සැපයීම්)/විවිධ/2023

ඔබේ අංකය / உமது இல / Your No. )

දිනය / திகதி / Date ) 2023.03. 24

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

31 MAR 2023

පොදු චක්‍රලේඛ ලිපි අංක : 01-13/2023

සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති
සියළුම ආයතන ප්‍රධානීන් වෙත.

<u>රෝගීන්ගේ හා කාර්ය මණ්ඩලයේ මානසිකත්වය රැකබලා ගැනීමේ කාර්යය</u>

ඉහත මැයෙන් 2003.12.30 දිනැතිව නිකුත් කරන ලද සෞඛ්‍ය ලේකම්ගේ අංක 02-145/2003 දරණ පොදු චක්‍රලේඛ ලිපිය කෙරෙහි අවධානය යොමු කරවමි. ඒකී ලිපිය මඟින් සෞඛ්‍ය ආයතන පරිශ්‍ර තුල කළු කොඩි ප්‍රදර්ශනය කිරීම තහනම් කර ඇත.

02. සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් වර්තමාන සමාජීය හා ආර්ථික තත්ත්වයන් හමුවේ රෝගීන් රැක බලා ගැනීම සහ රෝගී ජීවිත බේරාගැනීම සඳහා සියලුම සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සමඟ එක්ව ඉටුකරනු ලබන සුවිශේෂ වූ කාර්යභාරය රටේ අත්‍යාවශ්‍ය සේවාවක් ලෙස අගය කරන අතර, ඇතැම් වෘත්තිය ක්‍රියාමාර්ග හේතුවෙන් එම පිවිතුරු අරමුණට බාධාවන් එල්ල වී ඇති බව නිරීක්ෂණය වේ.

03. ජීවිත අවදානමකට මුහුණ දී සිටින රෝගියෙකු කළු කොඩියක් දැකීම පවා ඔවුන්ගේ මානසික තත්ත්වය බිඳවැටීමක් වශයෙන් අර්ථකථනය කළ හැකි ය. තව ද වෛද්‍යවරුන්, හෙද හෙදියන් ඇතුළු අනිකුත් සෞඛ්‍ය කාර්යය මණ්ඩලය රෝගී ජීවිත බේරා ගැනීම සඳහා කැපවීමෙන් සිදු කරනු ලබන ප්‍රයත්නයට එමඟින් බාධා එල්ලවන අතරම, සෞඛ්‍ය කාර්යය මණ්ඩලයේ මානසික තත්ත්වය බිඳවැටීමට ද එය හේතු වේ.

04. එබැවින් සෞඛ්‍ය ආයතන පරිශ්‍රයන් තුල උක්ත පොදු චක්‍රලේඛ ලිපියෙන් සිදුකරන ලද නියෝගය පරිදි කළු කොඩි එසවීම නොකළ යුතු බවටත් බැනර් ප්‍රදර්ශනය නොකල යුතු බවටත් මෙයින් දන්වමි.

එස්. ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය

"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

පිටපත් :- 1. පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්
2. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්